(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 2 (2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 ජනවාරි 10 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ජනවාරි 20 සිකුරාදා)**

350/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා මරණ දඬුවම නියම වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, මරණ දඬුවම නියම කරන ලද අධිකරණය, මරණ දඬුවම නියම කරන ලද දිනය සහ මරණ දඬුවම ලබා දීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පුද්ගලයන් අතරින් ජනාධිපති සමාව යටතේ නිදහස් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පුද්ගලයාගේ නම සහ නිදහස් කරන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 පෙබරවාරි 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3088/2022

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණ ස්ථාන රාශියක් බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති බව දන්නේද;

(ii) එම ස්ථාන හඳුනාගෙන ඊට සම්බන්ධ තොරතුරු වෙබ් අඩවිවලට ඇතුළත් කිරීමට කටයුතු කර තිබේද;

(iii) එම තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේද;

(iv) එම ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ සනීපාරක්ෂාව වෙනුවෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3118/2022

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් නිෂ්පාදනය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) වැඩි වශයෙන් ගම්මිරිස් වගාකරනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) වාර්ෂිකව අපනයනය කරනු ලබන ගම්මිරිස් ප්‍රමාණය කොපමණද;

(v) ඉන් ලබන වාර්ෂික අපනයන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එම යන්ත්‍ර ආනයනය කරන්නේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට වාර්ෂිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3168/2022

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීනි කිලෝග්‍රෑමයක් සඳහා පනවා තිබූ රුපියල් 50ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2020 ඔක්තෝබර් 13 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට ශත 25 දක්වා අඩු කරන ලද බවත්;

(ii) එහිදී විශාල වංචාවක් සිදු වූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් සිද්ධියට අදාළ විමර්ශනවල වත්මන් ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3173/2022

ගරු මයන්ත දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයේදී ලබා දෙන ලද පොරොන්දුවක් අනුව සිදු කරන ලද බදු අඩු කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් සිට මේ දක්වා රජයට අහිමි වූ බදු මුදල කොපමණද;

(ii) එම බදු අඩු කිරීම හේතුවෙන් අහිමි වූ මුදල, පියවා ගැනීමට කටයුතු කරන ලද ආකාරය කවරේද;

(iii) එම බදු අඩු කිරීම, ජනතාවට සහන සැලසීම සඳහා බාධාවක් වී තිබේද;

(iv) අඩු කරන ලද එම බදු නැවත වැඩි කිරීමට තීරණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3209/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

(iii) අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර ඇති රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන විසින් වාර්ෂිකව ගිණුම් වාර්තා ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3219/2022

ගරු සුදත් මංජුල මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක පක්ෂි වර්ග කවරේද;

(ii) එම පක්ෂීන් පැමිණෙන රටවල් කවරේද;

(iii) එම පක්ෂීන් ශ්‍රී ලංකාවට පැමිණි පසු වාසය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) එම පක්ෂීන් නැරඹීම සඳහා දේශීය හා විදේශීය සංචාරකයන් දැනුම්වත් කිරීමට සහ දිරිගැන්වීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3236/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස 2020 වසරේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කරනු ලැබූ උපාධිධාරීන්ගෙන් යම් නිශ්චිත පිරිසක් පාසල්වලට අනුයුක්ත කරන ලද බවත්;

(ii) එම පිරිස පාසල් නිවාඩු කාලයේදී නැවත රාජ්‍ය ආයතන වෙත කැඳවනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභීන් පුහුණුව අවසානයේදී පත් කරනු ලබන්නේ ගුරුවරුන් වශයෙන්ද නැතහොත් සංවර්ධන නිලධාරීන් වශයෙන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් උපාධිධාරී අභ්‍යාසලාභීන් සේවය කරනු ලබන පදනම;

(ii) ඔවුන්ගේ සේවය ස්ථිර කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3262/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බේරුවල සිට හික්කඩුව දක්වා වූ මුහුදු තීරය ආශ්‍රිත සංචාරක කර්මාන්තය මේ වනවිට අඩාල වී ඇති බව දන්නේද;

(ii) එම මුහුදු තීරය ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක හෝටල් හිමිකරුවන් ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3277/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉඩම් විශාල ප්‍රමාණයක් අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති බව දන්නේද;

(iii) එසේ අනවසරයෙන් අත්පත්කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(iv) එම ඉඩම්, නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සන්තකයට ලබා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 පෙබරවාරි 08 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3269/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හ/ දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ පිහිනුම් තටාකය අර්ධ වශයෙන් නිම කර ඉදිකිරීම් කටයුතු නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පිහිනුම් තටාකයේ ඉදිකිරීම් කටයුතු නතර කිරීමට හේතු;

(ii) එම පිහිනුම් තටාකයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තංගල්ල, නෙටොල්පිටිය ගැමුණු මහා විද්‍යාලයේ ක්‍රීඩා පාසල සඳහා පසුගිය රජය විසින් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ බව දන්නේද;

(ii) මේ වනවිට එම ක්‍රීඩා පාසලේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3320/2022

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ මාර්ග කි.මී. 100,000ක් කාපට් කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට කාපට් අතුරා ඇති මාර්ගවල දිග;

(ii) ඉහත වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩ ආරම්භ කර ඇති මාර්ගවල දිග;

(iii) ඒ අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති මාර්ගවල දිග;

කිලෝමීටර්වලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල සිට බිබිලේගම දක්වා මාර්ගයේ කිලෝමීටර් 5ක් කාපට් අතුරා සංවර්ධනය කිරීමේ වැඩ කටයුතු මේ වනවිට නතර කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාව දුෂ්කරතා රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් මාර්ගයේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) කොන්ත්‍රාත් ගිවිසුම අනුව වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) එම මාර්ගයේ සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3335/2022

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඉල්ලුම් කරනු ලබන රටවල් කවරේද;

(ii) එම එක් එක් රට විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන බවට දන්වා ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා සඳහා භාෂා සහතික අවශ්‍ය රටවල් කවරේද;

(ii) වලංගු වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය රටවල් කවරේද;

(iii) භාෂා සහතික සහ වෘත්තීය පුහුණු සහතික අවශ්‍ය නොවන රටවල් තිබේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විදේශ රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම්, කඩිනමින් සපුරාලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3372/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් දිස්ත්‍රික්කයේ, මුරුංගන් රෝහල 2018 වර්ෂයේදී මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද නමුත්, මේ දක්වා ඊට සරිලන පරිදි එම රෝහලට අවශ්‍ය පහසුකම් සපයා නොමැති බව දන්නේද;

(ii) වෛද්‍යවරු ඇතුළුව එම රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහලේ මෘත ශරීරාගාරයක් නොමැති වීම හේතුවෙන් මෘත ශරීර මන්නාරම මහ රෝහල වෙතට රැගෙන යාමට සිදු වීමෙන් මහජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, මුරුංගන් රෝහල සඳහා මෘත ශරීරාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) මුරුංගන් රෝහලේ සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3579/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙහි වින්දිතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ප්‍රහාරයෙහි වින්දිතයන් සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්දේශ කවරේද;

(iii) මේ වනතෙක් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති බව දන්නේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) ඉහත සඳහන් ප්‍රහාරයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ බවට චෝදනා එල්ල වී ඇති, අත්අඩංගුවට ගෙන ඇති සහ බන්ධනාගාර ගත කර ඇති පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3583/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඛණ්ඩ විදුලිබල සැපයුමක් සඳහා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට දිනකට අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට පවතින විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ගල් අඟුරු සැපයීම සඳහා ලංසුකරුවන් ඉදිරිපත් නොවන බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් ගල් අඟුරු සඳහා ක්ෂණික මිලදී ගැනීම් කිරීමට සිදු වී ඇති බව දන්නේද;

(iv) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3930/2022

ගරු ඉම්තියාස් බාකීර් මාකර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 746-ඉදිරිලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පාසල් මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ කළුතර කාර්යාලය විසින් සිදු කරන ලද බවත්;

(ii) ඒ අනුව පළමු අදියර ලෙස ඉහත මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරන ලද බවත්;

(iii) මේ වනවිට එම කොන්ක්‍රීට් ගල්, වර්ෂා ජලයට ගසාගෙන යාම හේතුවෙන් එම මාර්ගය අබලන් වී ගමනාගමනය සඳහා නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත අ(iii) හි සඳහන් කරුණු හේතුවෙන් මුදල් අපතේ යාමක් සිදු වී තිබේ නම්, ඊට වගකිව යුතු පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4070/2022

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන රෝහලක් වන මුල්ලේරියාව, නැගෙනහිර-කොළඹ මූලික රෝහල වෙත විවිධ අවශ්‍යතා සඳහා පැමිණෙන ජනතාවගේ භාවිතය පිණිස ඇති පොදු ප්‍රවාහන සේවය ඉතාමත් අකාර්යක්ෂම බවත්;

(ii) එම රෝහලට පැමිණීම සඳහා ඇති එකම මගී ප්‍රවාහන සේවාව වන්නේ මාර්ග අංක 164 - සල්මල් උයන - පුරහල බස් සේවාව බවත්;

(iii) එම බස් සේවාව ද ප.ව. 6.00න් පසුව ක්‍රියාත්මක නොවන බැවින් ජනතාව දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විවිධ අවශ්‍යතා සඳහා ඉහත රෝහලට පැමිණෙන ජනතාවට කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සපයා දීම පිණිස ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 පෙබරවාරි 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්ධන මිල තීරණය කිරීම සඳහා රජය විසින් මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, 2022.05.24 දිනෙන් පසු එම මිල සූත්‍රයට අනුව ඉන්ධන මිල සංශෝධනය කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ඉන්ධන මිල සංශෝධනය කරන ලද එක් එක් දිනය සහ සංශෝධනය කරන ලද මුදල එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2022.08.01 දින ලෝක වෙළඳපළේ ඛනිජ තෙල් මිල අඩු වූ ප්‍රතිශතයට සාපේක්ෂව මිල සංශෝධන සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

232/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, වේරදුව බණ්ඩාරනායක විදුහලේ ක්‍රීඩාංගනය, ප්‍රදේශයේ ක්‍රීඩකයන් පුහුණුවීම් සඳහා භාවිතා කරන ලද බවත්;

(ii) එම භූමිය ව්‍යාපාර කටයුත්තක් සඳහා ලබා දීමට හිටපු ප්‍රාදේශීය ලේකම්වරිය විසින් කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භූමිය ලබා දීමේදී ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් කැඳවන ලද දිනය කවරේද;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ටෙන්ඩරයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ටෙන්ඩරය ලබා ගන්නා ලද පුද්ගලයාගේ/ආයතනයේ නම, ලිපිනය හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ක්‍රීඩාංගනය, ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රදේශයේ ජනතාවට නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

303/2022

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ වගා කර ඇති ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක හේතුවෙන් සිදු වන පාරිසරික විනාශය ගණනය කර තිබේද;

(ii) එම ශාක ඉවත් කිරීමට අදාළ වැඩසටහනේ මේ වනවිට ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක වගා කර ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්, පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) රජයේ ඉඩම්වල වගා කර ඇති ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක ඉවත් කර එම ඉඩම් වගාකිරීම සඳහා තරුණ වගාකරුවන්ට ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

348/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණුව ලබන අභ්‍යාසලාභියෙකු සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(ii) සීමාවාසික කාලය තුළදී එම අභ්‍යාසලාභියෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත ගෙවීම ඉහළ නංවන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් අවස්ථාවේ ඉහළ නංවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට ඉහත අභ්‍යාසලාභියකු වෙත ගෙවනු ලබන වැටුප හා දීමනා වර්තමාන ජීවන වියදම සමඟ සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම වැටුප හා දීමනා ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3913/2022

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැව් හා ගංගාවල පිහිටා ඇති දූපත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දූපත් පිහිටා ඇති ජලාශ හා ගංගා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූපත් විවිධ වාණිජ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාකාරකම් කවරේද;

(iii) එම ක්‍රියාකාරකම් පරිසර හිතකාමී ලෙස සිදු කරන්නේද;

(iv) එම දූපත් බදු දී තිබේද;

(v) අදාළ බදු මුදල් නිසි පරිදි අය කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3916/2022

ගරු මුජිබුර් රහුමාන් මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලාන, ජාත්‍යන්තර ගුවන් තොටුපළක් බවට පත් කරන ලද දිනය කවරේද;

(ii) එම ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන් තොටුපළක් බවට පත් කිරීමට අදාළ උත්සවය පවත්වන ලද දිනය කවරේද;

(iii) එම උත්සවය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් සපයන ලද ආයතනයේ නම කවරේද;

(v) රත්මලාන ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3932/2022

ගරු විජිත හේරත් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006.12.14 දින ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අත්සන් කරන ලද අංක 2217–SRI ණය ගිවිසුම සහ මාර්ග සංවර්ධන අධිකාරිය හා එම බැංකුව අතර අත්සන් කරන ලද අංක 2767-SRI ණය ගිවිසුම අනුව ජාතික මාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද ජාතික මාර්ග සංඛ්‍යාව, එම එක් එක් මාර්ගයේ නම, මාර්ග අංකය සහ දිග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) අංක බී153 දරන හික්කඩුව-බද්දේගම-නිල්හේන මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ප්‍රතිස්ථානගත කිරීමේ සැලැස්මේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) ඉහත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා හික්කඩුව, ගෝනාපීනුවල සහ බද්දේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ඉඩම් හා ගොඩනැගිලි රජයට අත්පත්කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් සහ ආයතන සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන් හා ආයතනවලට වන්දි හා අනෙකුත් දීමනා ගෙවීම සම්බන්ධ සියලු සටහන් ඇතුළත් ලාර්ක් කමිටු තීරණ සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3934/2022

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රම බලකාය සහ ජනගහනය සන්සන්දනය කිරීමේදී, ශ්‍රී ලංකාව විශාලතම රාජ්‍ය සේවයක් සහිත රට බව පිළිගන්නේද;

(ii) රාජ්‍ය සහ ත්‍රිවිධ හමුදාවල සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ සේවකයන් සංඛ්‍යාව අඩු කිරීමට යෝජනා කර තිබේද;

(iv) ඒ අනුව, අඩු කරන සේවක සංඛ්‍යාව සහ කාල වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ සේවයේ, සේවක අතිරික්තයට පිළියමක් ලෙස විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 සිට 60 දක්වා අඩු කළේ නම්, ඒ සඳහා ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන්නේද;

(ii) දේශීය/විදේශීය පෞද්ගලික රැකියාවල නියැලීමට රජයේ සේවකයන්ට වැටුප් රහිත නිවාඩු ලබා දීමේ ක්‍රමවේදය යටතේ නිවාඩු ලබා ගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) විශ්‍රාම ගැන්වීමේ වයස අඩු කිරීම හේතුවෙන් පුරප්පාඩු වන තනතුරු සඳහා නව බඳවාගැනීම් නොකරන්නේ නම්, මේ වනවිට සිටින සේවකයන් එම තනතුරුවලට බඳවාගැනීම පිණිස බඳවාගැනීමේ පටිපාටි සංශෝධනය කර විවෘත විභාග ක්‍රමයක් හඳුන්වා දෙන්නේද;

(iv) පෞද්ගලික අංශයේ විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3937/2022

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරුන් සංඛ්‍යාව, එම පාසල්වල මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව සහ එම පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4072/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදු පදනම මත මේ වනවිට පුද්ගලික සමාගම් වෙත ලබා දී ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල ඇති තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලාවල වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තේ කර්මාන්තශාලා ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තේ කර්මාන්තයට අහිතකර බලපෑමක් සිදු වන්නේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලා නැවත සක්‍රිය කර තේ කර්මාන්තය නගා සිටුවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 පෙබරවාරි 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

681/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය සඳහා මේ වනවිට යොදා තිබෙන දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දුම්රියේ ගමනාන්තය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) භාණ්ඩ ප්‍රවාහනය කිරීමට වැඩි වශයෙන් දුම්රිය යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

972/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පළුකාමම්, වීරච්චේනයි, මායාපුරම් සහ වන්නි නගර් යන ගම්මානවල ජීවත්වන ජනතාවට පානීය ජල ගැටලු පවතින බවත්;

(ii) පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඉහත ගම්මානවල ජනතාව බැහැර යා යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවල ජීවත්වන, පානීය ජල අවශ්‍යතා සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ගම්මානවල පවතින ජල ගැටලුව විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 - 2019 "යහපාලන රජය" සමයේ ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සිදු වූ බව දන්නේද;

(ii) එම වංචාව හේතුවෙන් සිදු වී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ලවී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1518/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සහල් අවශ්‍යතාවය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සහල් ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරනු ලබන සහල් ප්‍රමාණය කොපමණද;

(iv) වර්ෂ 2016 සිට 2018 දක්වා සහල් ආනයනය කරනු ලැබුවේද;

(v) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වී අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) එම වී අස්වැන්න සහල් බවට පරිවර්තනය කළ පසු මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) 2014 වර්ෂයේ අතිරික්ත සහල් නිෂ්පාදනය කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ වී අස්වැන්න සහ නිෂ්පාදනය කරන ලද සහල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වර්ෂවලදී අතිරික්ත සහල් නිෂ්පාදනයක් පැවතියේ නම්, එම ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම වර්ෂවලදී සහල් ආනයනය කරනු ලැබුවේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1533/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(ii) වර්ෂ 2020/2021 මහ කන්නයේදී බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(iii) එම කන්නයේ වගා කිරීම සඳහා භාවිත කරන ලද දේශීය බඩඉරිඟු බීජ ප්‍රමාණය සහ ආනයනික බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iv) දේශීය බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් එකක සහ ආනයනික බීජ කිලෝග්‍රෑම් එකක මිල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අක්කර එකක බඩඉරිඟු වගාකිරීම සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය;

(ii) එම බීජ සඳහා වැය වන මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1676/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇලහැර-ගිරිතලය අභයභූමියේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(ii) මේ වනවිට එම අභයභූමියට අයත් අක්කර 250ක් පමණ විශාලත්වයකින් යුත් ප්‍රදේශයක විශාල පරිසර හානියක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1901/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද M - 9 දුම්රිය එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය එන්ජින් ආනයනය කරන ලද වර්ෂය කවරේද;

(iii) ඒවා ආනයනය කරන ලද රට කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් දුම්රිය එන්ජින් අතරින් මේ වනවිට ධාවනය කරනු ලබන සහ ගාල් කර ඇති දුම්රිය එන්ජින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අවශ්‍යතාවය අනුව පමණක් දුම්රිය එන්ජින් සහ දුම්රිය මැදිරි ආනයනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) මේ වනවිට ගාල් කර ඇති දුම්රිය එන්ජින් හා දුම්රිය මැදිරිවලින් යම් ප්‍රයෝජනයක් ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/2022

ගරු ජේ. සී. අලවතුවල මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක දෙක තුළ ලියාපදිංචි කර ඇති පුද්ගලික බස්රථ සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් බස්රථයේ අයිතිකරුගේ නම, ලිපිනය, එම එක් එක් බස්රථය අන්තර් පළාත් බස්රථයක්ද නැතහොත් දිස්ත්‍රික්කය තුළ ධාවනය කරනු ලබන බස්රථයක්ද සහ අන්තර් පළාත් බස්රථයක් නම්, ආරම්භක ස්ථානය සහ ගමනාන්තය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2046/2022

ගරු වේලු කුමාර් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකාවට ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් එම නගරයේ පිහිටා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පූජනීය ස්ථාන සහ ගොඩනැගිලි කවරේද;

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ලබා දෙනු ලබන වාර්ෂික මූල්‍යාධාරය කොපමණද;

(iv) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනාගෙන ඇති පෞද්ගලික ගොඩනැගිලි කවරේද;

(v) එම ගොඩනැගිලි හිමිකරුවන්ටද කිසියම් මූල්‍යාධාරයක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)(i)හි සඳහන් ස්ථාන ඒ අයුරින්ම පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) ඒවායේ වෙනස්කම් සිදු කිරීමට අවසර ලබා දී තිබේද;

(iii) මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2062/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය සඳහා මුදල් සපයා ගනු ලැබූ ප්‍රභවය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලද ණය මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මඟින් ඉපයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?